වාවකච්චේරිය ප්‍රාදේශිය සභාව

යාපනය දිසත්‍රික්කය

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව සභාවේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 22 දින ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරිය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම්

---------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා

-------------------------

i. මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා වත්කම් හා බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | බැරකම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 261,790 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 05 | 662,968 |

ii. සභාවට පරිත්‍යාග කරනු ලැබූ අංක ඩබ්පිආර්ඩී 4359 දරන සීසැම් යන්ත්‍රයේ වටිනාකම නිශ්චය කර ගිණුම් වලට ඇතුලත් කර නොමැති බැවින් වාහන වටිනාකම අඩුවෙන් දැක්විණි.

iii. කොඩිකාමන් බහු කාර්ය ගොඩනැගිල්ලේ සහ එහි ඉඩමේ වටිනාකම නිශ්චය කර ගිණුම් වලට ඇතුලත් කර නොමැති බැවින් ඉඩම් හා ගොඩනැගිලි විටිනාකම අඩුවෙන් දැක්විණි.

1.3.2 අනුකූල නොවීම්

පහත සඳහන් නීති රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නිති, රිති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා ( මුල්‍ය හා කළමනාකරණ ) රීති 1989 | | |
| පරිච්ඡේදය 11 වගන්තිය 66 | - | රු.982,508 ක් වූ හිඟ ආදායම් අයකර ගැනිමට සහා ලේකම් කටයුතු කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | - | වසර දෙක ඉක්මවූ රු.1,608,925 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

----------------------------------------------

වගන්තිය - 152(ඌ) - රු.1000 ඉක්මවන විනෝද කටයුතු වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. එනමුත් එවැනි අනුමැතියකින් තොරව සභා අරමුදලෙන් රු.36,880 ක් වැයකර තිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

-------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.13,368,554 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,451,144 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,139,405 ක් විය.

2.2 මූල්‍ය පාලනය

--------------------

අයවැය විධිමත්ව සකසා නොමැතිකම නිසා අයවැයගත හා තත්‍ය ආදායම අතර රු.4,145,144 ක වෙනසක් ද අයවැයගත හා තත්‍ය වියදම අතර රු.5,435,340 වෙනසක්ද පැවති බැව් විගණනයේදි නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

--------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම තත්‍ය ආදායම හා හිඟ ආදායම්

---------------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 110 | 142 | 908 |
| බදු කුලි | 10,462 | 10,724 | 66 |
| බලපත්‍ර ගාස්තු | 2,117 | 2,378 | 6 |
| වෙනත් ආදායම් | 35,163 | 38,752 | 2 |

2.3.2 වත්කම් කළමනාකරණය

-------------------------------

i. රු.90,823,422 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

ii. සභා බල ප්‍රදේශය තුල වූ වත්කම් යලි තක්සේරු කිරිමක් වසර 10 කට අධික කාලයක් තුල කර නොතිබූ බැවින් වරිපනම් හා බදු ආදායම් අඩුවී තිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

--------------------

2012 හා 2013 වර්ෂ සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් දැක්වෙන රු.6,424,300 ක ලැයිස්තුවක් ලබාගෙන තිබුණි. එනමුත් එය ලැබිය යුතු මුදලක් ලෙස මුල්‍ය ප්‍රකාශ වල දක්වා නොතිබුණි.

2.3.4 (i) 2006, 2007, 2010, 2011 හා 2012 වර්ෂ සඳහා ලැබිය යුතු රු.43,972,590 ක් වූ දඩ මුදල් ආදායම් හෝ ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම් වල දක්වා නොතිබුණි.

(ii) මෙම වාර්තාවේ දින වන විටත් 2013 වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු ලැයිස්තුව ලැබී නොතිබුණි.

2.3.5 අයවිය යුතු සේවක ණය

------------------------------

මියගිය/වැඩ තහනමට ලක්වූ සේවකයන්ගෙන් අයවිය යුතු සේවක ණය මුදල රු.10,819 ක් විය. එම මුදල ඇපකරුවන්ගෙන් අය කිරීමට අවුරුදු 5 කට අධික කාලයක් තුල කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

------------------------------

2.4.1 නිෂ්ක්‍රිය වත්කම්

----------------------

i. සභාවට අයත් වාහන 4 ක් නිෂ්ක්‍රියව පැවති බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

ii. සභාව විසින් මිලදී ගත්/ලෝක ආහාර වැඩසටහන මගින් ලබාගත් රු.260,890 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් නිෂ්ක්‍රියව ගබඩාවේ පැවතිණි.

2.5 සමීක්ෂණ මණ්ඩල වාර්තා

------------------------------------

2013 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මන්ඩල වාර්තා තොග ලේඛණ සමග සැසඳීමේදි අයිතම 16 ක අතිරික්තයක් හා අයිතම 10 ක ඌනතාවයක් හෙළිවිය.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

2.6.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

----------------------------------------------

i. වටිනාකම රු.5,793,020 ක් වූ ව්‍යාපෘති 37 ක් වර්ෂය ආරම්භක අවස්ථාවේදි පටන් නොගෙන ඒ වෙනුවට වර්ෂය අවසානයේදි ආරම්භ කර එකී මුදල් විවිධ ණයගැතියන් සේ දැක්විණි.

ii. වටිනාකම රු.450,000 ක් සඳහා වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 2 ක් සඳහා භාණ්ඩ ණයගැතියන් යටතේ 2011 හා 2012 වර්ෂ වලදී ප්‍රතිපාදන සලසා ඇතත් එම ව්‍යාපෘති මෙම වාර්තාවේ දින දක්වාත් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.6.2 අත්හරින ලද ව්‍යාපෘති

---------------------------

අයවැය මගින් රු.1,400,000 ක ප්‍රතිපාදන සලසා තිබූ ප්‍රාග්ධන ව්‍යාපෘති 8 ක් අත්හැර දමා තිබුණි.

2.6.3 අනුමත නොකළ ප්‍රාග්ධන ව්‍යාපෘති

-------------------------------------------

සමලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන අනුමත කර නොතිබූ වටිනාකම රු.1,750,000 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති හතරක් සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් ක්‍රියාත්මක කර තිබුණි.

2.6.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පළාත් පාලන කොමසාරිස් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් පරිත්‍යාග වශයෙන් ලද රු.183,719 ක් නියමිත කටයුතු සඳහා යොදා නොගෙන මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ බැවින්, මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබී තිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

i. පරිපනම් හා බදු
ii. වත්කම් තක්සේරු කිරිම
iii. අයවැය
iv. වාහන උපයෝජනය
v. ගිණුම්කරණය
vi. ආපසු ගෙවිය යුතු තැන්පතු